සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 10 - 2023

# කතෝලික ධර්මය I

කාලය පැය 01 යි

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති වරණ අතරින් දී ඇති නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

01 ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමට අයත් පොත් සංඛ්‍යාව,
(1) 26 කි. (2) 36 කි. (3) 46 කි. (4) 76 කි.

02 එළිදරව් වාදි සාහිත්‍යයට අයත් කෘතියකි,
(1) දානියෙල් (2) ගජාන් කතාව (3) ආමොස් (4) රූත් කතාව

03 සීනායි ගිවිසුමට පක්ෂපාතීව ජීවත් වන තරමට අපට දේවාශිර්වාදය ලැබෙන බව පෙන්වා දෙන්නේ,
(1) උත්පත්ති සිට ගජාන් කතාව දක්වා පොත් මඟිනි.
(2) ජෝෂුවා සිට 2 රාජාවලිය දක්වා පොත් මඟිනි.
(3) නෙහෙමියා සිට 2 මකබ් දක්වා පොත් මඟිනි.
(4) ජෝබ් සිට සිරාක් දක්වා පොත් මඟිනි.

04 දේව වචනය පරම්පරාවෙන් පරම්පරාවට දායාද කළ සම්ප්‍රදාය කුමක්ද?
(1) යාමේ සම්ප්‍රදාය (2) වාචික සම්ප්‍රදාය (3) ලිඛිත සම්ප්‍රදාය (4) එලොහිම් සම්ප්‍රදාය

05 ශුද්ධ වූ ලූක් තුමා විසින් රචිත පොත් දෙකකි,
(1) ලූක් සුභාරංචිය හා මාර්ක් සුභාරංචිය.
(2) ලූක් සුභාරංචිය හා අපොස්තළුවරුන්ගේ ක්‍රියා පොත.
(3) ලූක් සුභාරංචිය හා මතෙව් සුභාරංචිය.
(4) ලූක් සුභාරංචිය හා ජොහාන් සුභාරංචිය.

06 නව ගිවිසුමේ එළිදරව් සාහිත්‍යයට අයත් කෘති සංඛ්‍යාව .
(1) 4 කි. (2) 3 කි. (3) 2 කි. (4) 1 කි.

07 අපොත්තලික යුගයේ දී ශුද්ධව් සභාවට මහඟු සේවයක් කළ විශිෂ්ට පුද්ගලයෙකි,
(1) සාමුවෙල්. (2) බාරුක් (3) පාවුළු (4) ජෝශප්

08 කතෝලික සංදේශ හඳුන්වන තවත් නමකි,
(1) විශ්ව සංදේශ (2) කිතුණු සංදේශ (3) ලිඛිත සංදේශ (4) මුල් කිතුණු සංදේශ

09 2 තෙසලෝනික ග්‍රන්ථය,
(1) පාවුළු තුමා විසින් ම ලියන ලද සංදේශයකි. (2) ද්විතීය පාවුළු සංදේශයකි.
(3) ආරූඪ කර්තෘත්ව සංදේශයකි. (4) වෙනත් සංදේශයකි.

10 සැඟව තිබූ යමක් ප්‍රකාශ වීම හෝ අනාවරණය වීම,
(1) එළිදරව්ව සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනයේ අර්ථය යි.
(2) යුගාන්තවාදය සඳහා යෙදෙන ග්‍රීක වචනයේ අර්ථය යි.
(3) යුගාන්තවාදය සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනයේ අර්ථය යි.
(4) එළිදරව්ව සඳහා යෙදෙන ග්‍රීක වචනයේ අර්ථය යි.

11 යහපත් හා අයහපත් බලවේග අතර ගැටුමක් පෙන්නුම් කරනු ලබන්නේ,
(1) ද්විත්වවාදය මඟිනි (2) සංකේත භාවිතය මඟිනි
(3) යුගාන්තවාදය මඟිනි (4) ගුප්ත භාවය මඟිනි

12 4, 7, 10 පිළිවෙළින්,

(1) පූර්ණත්වය, පරිපූර්ණත්වය, ඉශ්‍රායෙල් ජනතාව සංකේතවත් කරයි.

(2) විශ්වය, පූර්ණත්වය, පරිපූර්ණත්වය සංකේතවත් කරයි.

(3) විශ්වය, පරිපූර්ණත්වය, දේව ජනතාව සංකේතවත් කරයි.

(4) පූර්ණත්වය, පරිපූර්ණත්වය, දේව ජනතාව සංකේතවත් කරයි.

13 යහපත හා අයහපත හඳුනාගෙන යහපත තම ජීවිතය තුළ ක්‍රියාත්මක කරමින් ජීවත් වීම,

(1) අවබෝධය යි. (2) හැකියාව යි. (3) ප්‍රඥාව යි. (4) දැනුම යි.

14 ප්‍රස්තාව පිරුළු, උපදේශ, කතාන්දර, සංකල්පනා, ගීත දක්නට ලැබෙන්නේ,

(1) ප්‍රඥා සාහිත්‍යයට අයත් කෘති තුළ ය. (2) දිවැසිවර ග්‍රන්ථ තුළ ය.

(3) එළිදරව්ව සාහිත්‍යයට අයත් කෘති තුළ ය. (4) ඉතිහාස ග්‍රන්ථ තුළ ය.

15 ''මෙතෙක් පටන් මනුෂ්‍ය පුත්‍රයාණන් දෙවියන් වහන්සේ ගේ බලපරාක්‍රමයේ දකුණු පස වැඩ හිඳිනු ඇත.'' යන පිළිතුරෙන් කුපිත වූ ජුදා නායකයින් ජේසුස් වහන්සේව ............. වෙත ගෙන ගියහ. මෙහි හිස්තැනට සුදුසු පිළිතුර වනුයේ,

(1) හෙරෝද් (2) නායක පූජක (3) ශ්‍රේෂ්ඨාධිකරණය (4) පිලාත්

16 අරමතියාවේ ජෝශප් අපට වැදගත් වන්නේ, ජේසුස් වහන්සේගේ

(1) භූමදාන කටයුතු වලට සම්බන්ධ වන නිසා ය. (2) කුරුසය උසුලාගෙන යාමට සහය දක්වන නිසා ය.

(3) තේජාශ්‍රීය දුටු නිසා ය. (4) විශ්වාස කළ නිසා ය.

17 ''ජේසු නසරේණු ජුදයින්ගේ රජ'' යන්න ප්‍රකාශ වන අක්ෂරය තෝරන්න,

(1) INRI (2) NIRI (3) IRNI (4) NRII

18 පෙන්තකොස්ත යන්නෙහි අර්ථය,

(1) සියය ය. (2) පණහ ය. (3) හතළිහ ය. (4) හත ය.

19 පේදුරුතුමා අන්‍යභාෂා කතා කරනු ලැබූ ස්ථානය ....... ය මෙහි හිස්තැනට උචිත වචනය තෝරන්න,

(1) ජේරුසලම් දේවමන්දිරය ය. (2) වතිකාන මන්ත්‍රණ සභාව ය.

(3) ජේරුසලම් චතුරස්‍රය ය. (4) වතිකාන නුවර ය.

20 සාවුල්ට ප්‍රසාද ස්නාපනය ලබා දුන් අනනියස් සිටියේ,

(1) රෝමයේ ය. (2) ඇතැන්ස්වල ය. (3) අන්තියෝනකයේ ය. (4) දටස්කයේ ය.

21 * වර්ෂය ක්‍රිස්තු වර්ෂ 47 පමණය.

* බාර්ණබස් තුමා හා ජොහාන් මාර්ක් තුමා සම්බන්ධ විය

* සිරියාවේ අන්තියෝනකය නගරයෙන් ආරම්භ විය.

* ගමන් මගේ අවසානය දර්බය විය.

ඉහත කරුණුවලින් පැහැදිලි වන්නේ පාවුළු තුමාගේ,

(1) පළමු ධර්මදූත චාරිකාව යි. (2) තුන්වන ධර්මදූත චාරිකාව යි.

(3) දෙවන ධර්මදූත චාරිකාව යි. (4) හතරවන ධර්මදූත චාරිකාව යි.

22 ''එහෙත් ඔබ කියන සේක් නම් දැල හෙළමි'' යනුවෙන් ප්‍රකාශ කළේ,

(1) ඇන්ඩෘ ය. (2) පේදුරු ය. (3) ජාකොබ් ය. (4) ස්තේපන් ය.

23 පේදුරු තුමා තමන්ගේ පව්කාර බව පිළිගත්තේ,

(1) ජේසුස් වහන්සේ අභියස දණින් වැටීමෙනි,

(2) ජේසුස් වහන්සේව සිප වැළඳ ගැනීමෙනි,

(3) ජේසුතුමා ඉදිරියේ මහා ප්‍රකාශය ඉදිරිපත් කිරීමෙනි,

(4) ජේසුස් වහන්සේ අභියස දෙනෙත් වසා ගැනීමෙනි,

24 කතෝලික සභාවේ 266 වන (දෙසීය හැට හය) සුදතුම් පියා කවුරුන්ද,

(1) ශුද්ධ බෙනඩික් සුදතුම් පියා (2) හයවන ලියෝ සුදතුම් පියා

(3) ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුළු සුදතුම් පියා (4) ශුද්ධ ප්‍රැන්සිස් සුදතුම් පියා

25 ශුද්ධවූ සභාවේ එකමුතු කම ගොඩනැගී ඇත්තේ,

(1) ඒකත්වය නිසා ය. (2) කතෝලිකත්වය නිසා ය.

(3) ශුද්ධත්වය නිසා ය. (4) අපෝස්තලිකත්වය නිසා ය.

26 සභා ඉතිහාසය තුළ ක්‍රිස්තු වර්ෂ 1505 ට පෙර යුගය හඳුන්වනු ලබන්නේ,

(1) පෘතුගීසි යුගය (2) පෘතුගීසින් පාලනය කළ යුගය

(3) පෘතුගීසින් පැමිණීමට පෙර යුගය (4) පෘතුගීසින් පාලනයෙන් පසු යුගය

27 A පළමු ධර්මදූත කණ්ඩායම පැමිණීම.

B කතෝලික දහම ඇදහීම තහනම් කිරීම.

C ශුද්ධ වූ පව්ලේ කන්‍යා සොයුරියන් හෝ පැවිදි නිකාය පැමිණීම.

D ජාකෝමේ ගොන්සල්වේස් පියතුමාගේ සේවාව.

E දිව්‍ය පූජාව පැවැත්වීම තහනම් වීම.

ඉහත සිදුවීම් වලින් ලන්දේසි සමයේ දී සිදු වූ සිදුවීම් වලට අදාළ අක්ෂර ඇතුළත් වරණය තෝරන්න.

(1) B, C හා D ය. (2) A, C හා E ය. (3) B, D හා E ය. (4) B, C හා E ය.

28 ''කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලය තුළ ම නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේ දී ඉටු කර ගත නොහැකි ය.'' යන්න ප්‍රකාශ කළේ,

(1) ජාකෝමේ ගොන්සල්වේස් පියතුමා ය. (2) මයිකල් රුද්‍රිගු පියතුමා ය.

(3) ජුසේවාස් පියතුමා ය. (4) මර්සලින් ජයකොඩි පියතුමා ය.

29 බ්‍රිතාන්‍ය යුගය තුළ මෙරටට පැමිණි ධර්මදූත කණ්ඩායම් වනුයේ,

(1) නිර්මල මරියා නිකාය, සිල්වෙස්ත්‍රෝ මෙනදිකාන නිකාය,

(2) ද්ලාසාල් සොහොයුරන්ගේ පැවිදි නිකාය, දොමිනිකාන ධරුමදූතවරු

(3) මාරිස්ට් සොහොයුරන්ගේ පැවිදි නිකාය, අගුස්තීනු ධරුමදූතවරු

(4) සිල්වෙස්ත්‍රෝ මෙනදිකාන නිකාය හා දොමිනිකාන නිකායක ධර්මදූතවරු

30 දේව ප්‍රසාද නිධානයන්ගේත් දේව ප්‍රසාද නිධානය ලෙස හඳුන්වනු ලබන ප්‍රසාද නිධානය කුමක්ද?,

(1) ප්‍රසාද ස්නාපනය (2) අභිවෘද්ධි ආලේපය

(3) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ (4) ආශිර්වාදකාර බන්ධනය

31 ''සාලොම්'' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

(1) සාමය වේවා! යන්න ය. (2) ජෙරුසලම් නුවරය.

(3) යන්න සාමයෙන් ජීවත්වන්න යන්න ය. (4) බෙත්ලෙහෙම් නුවරය.

32 සුභාරංචි කතුවරුන් හතර දෙනාම වාර්තා කරන එකම ප්‍රාතිහාර්යය,

(1) ලන්වියානෝ නුවර ප්‍රාතිහාර්ය ය.

(2) කානා නුවර වතුර මිදියුෂ බවට හැරවීමේ ප්‍රාතිහාර්යය.

(3) මුහුද මත ඇවිදීමේ ප්‍රාතිහාර්ය ය

(4) පූප වැඩිකිරීමේ ප්‍රාතිහාර්ය ය

33 දෙවියන් වහන්සේ මෝසෙස් ගේ උදව්වට යවනු ලැබුවේ,

(1) ආබ්‍රහම්ව ය (2) ජෝශප්ව ය (3) ආරොන්ව ය (4) ජෝෂුවා ය

34 රාත්‍රී භෝජනයෙන් පසුව ජේසුස් වහන්සේ තම ශ්‍රාවකයින් ගේ පාද සේදීම පිළිබඳව ඉදිරිපත් කරන සුවිශේෂක කතුවරයා,

(1) ජොහාන් තුමාය (2) මතෙව් තුමාය (3) මාර්ක් තුමාය (4) ලූක්

35 පුරාණ ගිවිසුමේ සත්ව පූජා වලට ප්‍රධාන තැනක් හිමි විය. එයට හේතුව වූයේ,සත්වයාගේ රුධිරය තුළ,

(1) මාංශය අන්තර්ගත වූ බැවින් ය. (2) ආහාර අන්තර්ගත වූ බැවින් ය.

(3) ලේ අන්තර්ගත වූ බැවින් ය. (4) ජීවිතය අන්තර්ගත වූ බැවින් ය.

36 පරණ ගිවිසුමේ විවිධ පූජා පැවතිය ද නව ගිවිසුමේ ඇත්තේ එකම යාගයකි. ඒ,

(1) රුධිරයේ යාගය යි. (2) කල්වාරි යාගය යි.

(3) දේවත්වයේ යාගය යි. (4) මනුෂ්‍යත්වයේ යාගය යි.

37 1995 ජනවාරි 20 ලංකාවට වැඩම කර ජුසේවාස් පියතුමාව භාග්‍යවරයාට ඔසවන ලද්දේ,

(1) පළමුවන ජුවාම් පාවුළු මුනිතුමා ය. (2) ශුධව් බෙනඩික් පාප්තුමා ය.

(3) ශුධව් ප්‍රැන්සිස් පාප්තුමා ය. (4) දෙවන ජුවාම් පාවුළු මුනිතුමා ය.

38 දැතෙහි සුදු රෝස ඔටුන්නක් හා රතු රෝස ඔටුන්නක් සහිතව දේවමාතාවක් දර්ශනය වූයේ,

(1) කිරිගෙන යන දරුවෙකුට ය. (2) මැක්ෂිමලියන් කෝල්බේ මුනිතුමාට ය.

(3) අන්තෝනි මුනිතුමාට ය. (4) ක්‍රීඩා කරමින් සිටි දරුවෙකුට ය.

39 එඬේරික ජීවිතයක් ගත කළත් ආබ්‍රහම් තුමා,

(1) සමාදානයේ පියා ලෙස හැඳින්විය. (2) ආදරයේ සාන්තුවරයා යන විරුදාවලිය ලැබීය

(3) සාධාරණයේ පියා ලෙස හැඳින්විය. (4) විශ්වාසයේ පියා යන විරුදාවලිය ලැබීය

40 විශ්වාසය, බලාපොරොත්තුව හා ප්‍රේමය පළමු පනත හා අත්වැල් බැඳගෙන ඇත්නම් එය සම්පූර්ණත්වයට පත්වන්නේ,

(1) පූජාවට සහභාගී වීම තුළින් ය. (2) ප්‍රසාද නිධාන ලබා ගැනීම තුළින් ය.

(3) යාඥාව තුළින් ය. (4) පුණ්‍ය ක්‍රියා ඉටුකිරීම තුළින් ය.

(ලකුණු 1 × 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 10 - 2023

# කතෝලික ධර්මය II

කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

01. (i) ශුද්ධ බයිබලයේ ඇති ජනප්‍රිය ඓතිහාසික කෘතීන් දෙකක් නම් කරන්න.

(ii) නව ගිවිසුමේ හසුන් වර්ගීකරණයේ කොටස් දෙක නම් කරන්න.

(iii) එළිදරව් සාහිත්‍යයේ සුදු හා කළු වර්ණ සංකේත මගින් පෙන්වා දෙන පණිවිඩ දෙක ලියන්න.

(iv) ජේසුස් වහන්සේ උකුත් වූ අවස්ථාවේ දී පරිසරය තුළ සිදු වූ වෙනස්කම් දෙකක් ලියන්න.

(v) පළමු ධර්මදූත චාරිකාවේ දී පාවුළු තුමා කළ කාර්යයන් දෙකක් ලියන්න.

(vi) පේදුරු තුමාගේ මහා ප්‍රකාශයෙහි අඩංගු කරුණු දෙක ලියන්න.

(vii) ජුසේවාස් තුමාගේ මවගේ හා පියාගේ නම් ලියා දක්වන්න.

(viii) ජේසුස් වහන්සේ මහා බ්‍රහස්පතින්දා දින ස්ථාපිත කළ ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.

(ix) ඉශ්‍රායලයේ පූජා බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(x) තෙරේසා මව්තුමිය ලොරෙටෝ පැවිදි නිකායට ඇතුළු වීමට හේතු වූ කරුණු දෙක ලියා දක්වන්න.

(ලකුණු 2 x 10 = 20)

02. (i) ශුද්ධ බයිබලය බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(ii) ශුද්ධ බයිබලයේ ඇති ඉතිහාස පොත් තුනක් ලියන්න.

(iii) එදිනෙදා ජීවිතයේ දී ශුද්ධ බයිබලය ඔබට සහනයක් වුණු අවස්ථාවක් ලියා කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

03. (i) 'හොක්මා' යන්නෙහි අර්ථය ලියා දක්වන්න.

(ii) සළමොන් රජු නොඉල්ලු ලෞකික සැප සම්පත් තුනක් ලියන්න.

(iii) දෙවියන් වහන්සේට ප්‍රසන්න දරුවෙක් වීමට ඔබේ ජීවිතයෙන් අත්හැරිය යුතු දේවල් පහක් ලියා කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

04. (i) එළිදරව්ව 22 : 13 ට අනුව ''අල්පා'' හා ''ඔමේගා'' යනු කුමක්ද?

(ii) උපස්ථායකයින් පත් කිරීමේ සළකා බැලූ ගුණාංග තුනක් ලියන්න.

(iii) අභිවෘද්ධි ආලේපය ප්‍රසාද නිධානය ලැබූ ඔබ අභියෝග හමුවේ ශුද්ධාත්ම වරමින් විශ්වාසයකට සාක්ෂි දරන්නේ කෙසේදැයි කරුණු පහකින් ඉදිරිපත් කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

05. (i) ශුද්ධවූ සභාවේ දෘශ්‍යමාන නායකයාව හඳුන්වන නම් දෙකක් ලියන්න.

(ii) ශුද්ධවූ සභාව තුළ පැවසිය යුතු අනිවාර්ය ලක්ෂණ තුනක් නම් කරන්න.

(iii) ශුද්ධවූ සභාවේ සාමාජිකයෙකු ලෙස ඔබ සතු වගකීම් පහක් ලියා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06. (i) බ්‍රිතාන්‍ය යුගය ආරම්භයේදීම මෙරට කිතුණුවන්ට ලැබුණු වරප්‍රසාද දෙකක් ලියන්න.

(ii) ජුසේවාස් පියතුමාගේ මෙරට සේවාව තුළ අත්දුටු ප්‍රාතිහාර්යයන් තුනක් ලියන්න.

(iii) ජුසේවාස් පියතුමාගෙන් කිතුණු ඔබගේ ජීවිතයට ගතහැකි ආදර්ශ පහක් ලියා පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07. පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) ජීවන සභා සම්ප්‍රදාය

(ii) මූලික කිතුණු සභාව

(iii) ශුද්ධ වු පේදුරු තුමා

(iv) ගරු මයිකල් රුද්‍රිගු පියතුමා

(ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

1. 46 කි.
2. දානියෙල්
3. හේෂුවා හා 2 රාජාවලිය පොත් මගිනි
4. වාචික සම්ප්‍රදාය
5. ලූක් සුභාරංචියහාඅපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොත
6. 1 කි.
7. පාවුළු
8. විශ්ව සංදේශ
9. ද්විතීය පාවුළු සංදේශයයි
10. එළිදරව්ව සඳහා යෙදෙන ග්‍රීක වචනයේ අර්ථය
11. ද්විත්ව වාදය මගිනි
12. විශ්වය, පූර්ණත්වය, පරිපූර්ණත්වය සංකේතවත් කරයි
13. ප්‍රඥාවයි
14. ප්‍රඥා සාහිත්‍යයට අයත් කෘති තුළය
15. පිලාත්
16. භූමදාන කටයුතු වලට සම්බන්ධ වන නිසාය
17. INRI
18. පණිහ ය
19. ජේරුසලම් චතුරස්‍රය ය
20. දමස්කයේය
21. පළමු වන ධර්මදූත චාරිකාවයි
22. පේදුරු ය
23. ජේසුස් වහන්සේ අභියස දණින් වැටීමෙනි
24. ශුද්ධ වූ ප්‍රැන්සිස් සුදතුම් පියා
25. ඒකත්වය නිසාය.
26. පෘතුග්‍රීසින් පැමිණීමට පෙර යුගය
27. B, D හා E ය.
28. ජුසේවාස් පියතුමාය.
29. නිර්මල මරියා නිකාය, සිල්වෙස්ත්‍රෝ මෙනදිකාන නිකාය,
30. II දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ
31. ජෙරුසලම් නුවරය.
32. පූප වැඩීමේ ප්‍රාතිහාර්ය.
33. ආරොන්ව ය
34. ජොහනේ තුමාය
35. ජීවිතය අන්තර්ගත වූ බැවින්ය,
36. කල්වාරිය යාගයයි
37. දෙවන ජුවාම් පාවුළු මුනිතුමාය.
38. මැක්ෂිමිලියන් කෝල්බේ මුනිතුමාටය
39. විශ්වාසයේ පියා යන විරුදාවලිය ලදී.
40. යාඥාව තුළය.

## II පත්‍රය

01. (i) රුක් කතාව / එස්තර්
(ii) ශුද්ධ වූ පාවුළුතුමාගේ ලිපි / වෙනත් ලිපි
(iii) සුදු - ජයග්‍රහණය / කළු සාගතය
(iv) හිරු අඳුරුවීම / අටපුරා අන්ධකාරය ඇතිවීම / දේව මාළිගාවේ තිරය දෙකඩ වීම
(v) සැම නගරයනටම ගොස් දේශනා කිරීම / කිතුණු සංඝ පිහිටුවීම, නායකයින් පත් කිරීම
(vi) ඔබ ක්‍රිස්තුවරයාණෝය / ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය
(vii) පියා - ක්‍රිස්ටෝපර්වාස් , මව - මරියා මිරැන්ඩා
(viii) දිව්‍ය සත්ප්‍රසාදය / පූජාන්වරය
(ix) දවන පූජා / නොදවන පූජා
(x) ගුරුවරියක හා කන්‍යා සොහොයුරියන් වීමට ඇති ආශාව නිසා

02. (i) පුරාණ ගිවිසුම / නව ගිවිසුම
(ii) 10 ශ්‍රේණිය පිටුව 1
(iii) ලියා ඇති කරුණු අනුව ලකුණු දෙන්න.

03. (i) සාර්ථකව හා ධර්මිෂ්ටව ජීවත් වීමේ හැකියාව
(ii) දීර්ඝායුෂ, සැප සම්පත්, සතුරන්ගේ ජීවිත විනාශය
(iii) ලියා ඇති කරුණු අනුව ලකුණු දෙන්න.

04. (i) ආරම්භය හා අවසානය
(ii) 10 ශ්‍රේණිය පිටුව 24
(iii) ලියා ඇති කරුණු අනුව ලකුණු දෙන්න.

05. (i) ශුද්ධෝත්තම පියතුමා / සුදතුම් පියා / පාප් වහන්සේ / පාප්තුමා
(ii) 10 ශ්‍රේණිය පිටුව 34
(iii) ලියා ඇති කරුණු අනුව ලකුණු දෙන්න.

06. (i) ලන්දේසි නීති අවලංගු කිරීම / කැමති ආගමක් ඇදහීම
(ii) 10 ශ්‍රේණිය පිටුව 40
(iii) ලියා ඇති කරුණු අනුව ලකුණු දෙන්න.

07. (i) 10 ශ්‍රේණිය 2 , 3 පිටු
(ii) 10 ශ්‍රේණිය 7 පාඩම
(iii) 10 ශ්‍රේණිය 9 පාඩම
(iv) 10 ශ්‍රේණිය 62 , 63 පිටු